## 333 බලව් බලව් අපේ දෙව්සුරෝ

බලව් බලව් අපේ දෙව්සුරෝ
මේ හැටි අප වෙතට ළං වුණෝ //

මිනිස් වගට පෑ වදාල දේව සෙනෙහසේ
ලකුණ මිනිස් බඳ ගතවුණු දෙව් පුතුන් මැවේ
දෙවියන් ගුණ කඳ මහිමේ හා පුරා කියා
ලොවට බෙදා දෙනු සඳහා වැඩම කළ නියා

ආවෙමි මම දෙන්නට මගෙ පණ ඔබට බෙදා
වැඩි වැඩියේ දෙන්නට ඒ සැටියකුත් තකා
දෙවියො මෙසේ කූඩාරම් ගසා ඉන්නටා
සිතු නියා මිනිසුන් හා හාදකම් වවා

ලෝ ගැලවුම් කරු හැටියට මෙලොවට වැඩියෝ
පව් කරුවන් වැළඳ ගත්හ ලෙඩුන් සුව කලෝ
පණ ගියවුන් හට ඔබ යළි ඒ පණ දුන්නෝ
ඔබ වෙතැ ආ හැම දෙනා මැ සනසා ලූවෝ

බැටළු එඩේරා මම හොඳ එසේ බැබැළුණෝ
ඒ සිරි බර සිරිත නිතර ඔබ පුරුදු කලෝ
මුළු ලෝ ජනතාවෝ ඔබෙ බැටළු රැළ වුණෝ
ඔවුන් එකතු කරනු පිණිසැ ඔබ පණ දුන්නෝ